**හැඳින්වීම**

මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ පිහිටි උතුරු පළාත පරිපාලන දිස්ත්‍රික්ක පහකින් සමන්විත වේ. ප්‍රමාණයෙන් ව.කි. 8834 ක් වූ උතුරු පළාතට යාපනය, කිලිනොච්චි, මුලතිව්, මන්නාරම සහ වව්නියාව යන දිස්ත්‍රික්කයන් ඇතුළත් වේ. උතුරු පළාතේ වූ පරිපාලන දිස්ත්‍රික්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 33 ක් ග්‍රාමනිළධාරී වසම් 931 සහ ගම්මාන 3235 කින් සමන්විත වේ. උතුරු පළාතේ වෙරළ තීරය දිගින් කි.මි. 480 ක් පමණ වන අතර එහි ධීවර ගම්මාන 234ක් පිහිටා ඇත. මෙයට අමතරව ප්‍රධාන සහ මධ්‍ය ප්‍රමාණයේ වැව් 54 ක් සහ කුඩා ප්‍රමාණයේ ජලාශ 1500 ක් උතුරු පළාතේ පිහිටා ඇත. මෙම ජලාශ වැඩි වශයෙන් කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ලබාගැනීමට උපයෝගි කරගත් අතර ධීවර කටයුතු සඳහා භාවිතා කරන ලද්දේ විරල වශයෙනි.

ගැටුම්කාරී තත්ත්වයට පෙර උතුරු පළාතේ ධීවර අංශය ප්‍රාදේශීය ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දුන් අතර ප්‍රජාවගේ ජීවනෝපාය, අදායම් සහ ප්‍රෝටීන් අවශ්‍යතාවයන් සඳහා මහගු ලෙස දායක විය. 1983 දී මුළු ධීවර නිෂ්පාදනයට මෙම දිස්ත්‍රික්ක 3 න් (මුලතිව්, යාපනය සහ මන්නාරම) වූ දායකත්වය 40% ක් විය. යාපනය දිස්ත්‍රික්කයේ පමණක් දායකත්වය 26% ක් පමණ වේ.

**2008 වසරේ උතුරු පළාතේ ධීවර අංශය හා සම්බන්ධිත මූලික දත්ත**

| | **කිලිනොච්චිය දිස්ත්‍රික්කය** | **මුලතිව් දිස්ත්‍රික්කය** | **යාපනය දිස්ත්‍රික්කය** | **මන්නාරම දිස්ත්‍රික්කය** | **වවුනියාව දිස්ත්‍රික්කය** | **උතුරු පළාත** |
|---|---|---|---|---|---|---|
| වෙරළ තීරයේ දිග කි.මි. | යාපනය දිස්ත්‍රික්කයට ඇතුළත් කර ඇත | 50.00 | 275.00 | 155.00 | - | 480.00 |
| ධීවර ගම්මාන | 40 | 31 | 107 | 41 | 15 | 234 |
| ධීවර පවුල් ගණන | 2,100 | 1,500 | 17,579 | 10,230 | 500 | 31,909 |
| සක්‍රිය ධීවර සංඛාව | 2,300 | 2,200 | 17,688 | 11,120 | 490 | 33,798 |
| ධීවර නිෂ්පාදනය මෙ.ටො. | 360 | 260 | 1,660 | 7,390 | 160 | 9,830 |
| ධීවර යාත්‍රා ගණන (ධීවර සංගණනය -2007) | | | | | | |
| බහුදින යාත්‍රා(IMUL) | - | - | - | - | - | - |
| එක්දින යාත්‍රා(IDAY) | - | - | 123 | 51 | - | 174 |
| පිටත සවිකරන ලද ඇන්ජිම සහිත පාරම්පරික යාත්‍රා(MTRB) | 240 | 100 | 420 | 173 | - | 933 |
| එෆ් ආර් පී යාත්‍රා(FRP) | 280 | 140 | 2,793 | 1657 | - | 4,870 |
| යාන්ත්‍රික නොවන සම්ප්‍රදායික යාත්‍රා(NTRB) | 270 | 150 | 3,430 | 428 | 120 | 4,398 |
| මාදැල් (NBSB) | - | 76 | 181 | 113 | - | 370 |
| තොටුපළ සංඛ්‍යාව | 17 | 26 | 128 | 50 | 23 | 244 |
| ධීවර සමුපකාර සමිති ගණන | 25 | - | 117 | 35 | 12 | 189 |
| ධීවර සමුපකාර සමිති සාමාජික සංඛ්‍යාව | 2,405 | - | 18,046 | 6,817 | 400 | 27,668 |

**ප්‍රභවය: ධීවර සංගණනය 2007, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය**

උතුරු පළාතේ අවුරුදු 25 කට වඩා පැවති ගැටුම්කාරී තත්ත්වය මත ධීවර අංශය මුළුමනින්ම පාහේ කඩා වැටුන අතර ධීවර අංශයේ ප්‍රගතිය පහළ අගයක් ගැණීන. ඒ සමගම ධීවර අංශයට විවිධ ගැටළුවලට මුහුණ පෑමට සිදුවිය. මෙම තත්ත්වය 2004 පැවති සුනාමි ව්‍යසනය සමඟ තවදුරටත් උග්‍ර අතට හැරිණ.
සාරංශ වශයෙන් ගත් කල උතුරු පළාතේ ධීවර අංශයේ පසුබෑමට පහත සඳහන් කරුනු විශේෂයෙන් බලපා ඇත..

- වසර 30 කට වැඩි කාලයක් උතුරු පළාතේ පැවති ගැටුම් කාරි තත්ත්වය මත සිදුවූ හානි
- ආරක්ෂක හේතු මත ධීවර කටයුතු සඳහා පණවන ලද කාලසීමාවන් සහ ප්‍රදේශ සීමාවන්
- නව තාක්ෂණය සහිත ධීවර යාත්‍රා සහ ධීවර ආම්පන්න හඳුන්වා දීමට නොහැකි වීම
- 2004 වසරේ සිදුවූ සුනාමි ව්‍යසනය මගින් වූ හානි
- යුධමය වාතාවරණය යටතේ ධීවර ප්‍රජාව අවතැන් වීම.
- මහින්ද චින්තන වැඩසටහන් යටතේ පිළියෙල කරන ලද 2007-2016 දක්වා වූ දශ අවුරුදු ධීවර සැලැස්ම මගින් ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමට අවස්ථාවක් නොලැබීම.

යුධමය වාතාවරණය යටතේ උතුරු පළාතේ ධීවර ජනතාවට අත් විඳීමට සිදුව ඇති ගැටලු සහ ක්ෂණික අවශ්‍යතාවයන් සහ ධීවර අංශයේ පසුබෑම සැලකිල්ලට ගත් කල ඉදිරි සැලසුම් ප්‍රවේශයක් යටතේ දස අවුරුදු ධීවර සංවර්ධන සැලැස්මට (2007-2016) අනුකූලව ක්‍රමෝපායන් 03 ක් යටතේ ධීවර අංශය සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් වී ඇත.

2007 - 2016 දක්වා වූ දස අවුරුදු සැලැස්ම මහින්ද චින්තන වැඩ සටහන යටතේ සම්පාදනය කොට ඇත. උතුරු පළාත සඳහා වූ ධීවර අංශයේ සංවර්ධන ක්‍රමෝපායයන් දින 180 කින් නිමකල යුතු ක්‍රියාකාරකම් (කෙටි කාලීන), දැවුරුදු මධ්‍යකාලීන ක්‍රියාකාරකම් සහ දිගු කාලීන ක්‍රියාකාරකම් වලින් සමන්විත විය යුතුය.

උතුරු පලාත්වාසී ප්‍රජාවගේ ජීවනෝපායන් පිළිබඳ ක්ෂණික අවශ්‍යතාවයන් සඳහා ප්‍රතිචාර දැක්වීමේදී වඩාත් ධණාත්මකව සහ ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමේ හැකියාවක් අනෙකුත් අංශයන්ට වඩා ධීවර අංශය සතුව පවතී. මෙයට අමතරව මෙම ප්‍රජාවගේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමට, ධීවර උප අංශවලට විශාල වශයෙන් දායක විය හැක.

**උතුරු පලාත සඳහා වූ ධීවර සංවර්ධන සැලැස්මේ අරමුණු**

- ගැටුම්කාරී තත්ත්වය හේතුකොට හානියට පත් සමාජ ආර්ථික සහ පාරිසරික තත්ත්වයන් යළි නගා සිටුවීම
- උතුරු පළාතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය ආයතනික රාමුව යළි ස්ථාපිත කිරීම සහ ශක්තිමත් කිරීම
- උතුරු පළාතේ අවතැන්වූ සහ ගැටුම්කාරී තත්ත්වයට මුහුණ දුන් ධීවර ප්‍රජාවගේ ජීවනෝපායන් යළි නගා සිටුවීම
- ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම
- 2007-2016 සඳහා වූ දස අවුරුදු ධීවර සංවර්ධන සැලැස්මට අනුකූලව ඉලක්කයන් ළඟාකර ගැන්ම සඳහා ධීවර නිෂ්පාදනයන් ඉහළ නැංවීම
- ගැටුම්කාරී තත්ත්වය සහ 2004 සුනාමි ව්‍යසනය හේතුකොට විනාශ වූ ධීවර යටිතල පහසුකම් නැවත ගොඩනැංවීම සහ සංවර්ධනය කිරීම
- වෙරළබඩ සම්පත් ඇතුලු ධීවර සම්පත් භාවිතයේ තිරසාරභාවය සහතික කරමින් වෙරළබඩ සහ ජලජ සම්පත් ආරක්ෂා කිරීම සඳහා සංරක්ෂණ පිළියම් යෙදීම
- ධීවර අංශයේ අපනයන ප්‍රවර්ධනය සහ විදේශ විනිමය ආදායම ඉහළ නැංවීම

**උතුරු පළාත සඳහා වූ ධීවර සංවර්ධන සැලැස්මේ විෂය පථය**

- ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය කිරීම සඳහා වූ ආයතනික රාමුව ශක්තිමත් කිරීම
- හඳුනාගත් දිස්ත්‍රික්ක පහ තුළ ධීවර ප්‍රජාවගේ ජීවනෝපායන් නගා සිටුවීම සඳහා කඩිනම් පිළියම් යෙදීම
- ධීවර යටිතල පහසුකම් නැවත ගොඩනැංවීම සහ සංවර්ධනය කිරීම
- ධීවර සමුපකාර සමිති ධීවර බැංකු සහ ප්‍රජා මූලික සංවිධාන නැවත ස්ථාපිත කිරීම
- ජලජීවී වගාවල මිරිදිය සහ කිවුල් දිය ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම
- ධීවර නිෂ්පාදන වෙළඳ පොළ සබඳතා ශක්තිමත් කිරීම
- නව ධීවර තාක්ෂණයන් හඳුන්වාදීම සහ පුහුණු කටයුතු
- වෙරළබඩ සම්පත් සංරක්ෂණය සහ ප්‍රතිස්ථාපනය
- ධීවර ක්ෂේත්‍රයට අදාල උපකාරක සේවා සංවර්ධනය
- ධීවර කාන්තාවන් සවිබල ගැන්වීම

**දින 180 කඩිනම් සංවර්ධන වැඩ සටහන**

- වෙරළබඩ සහ කිවුල් දිය ධීවර කර්මාන්තය  සඳහා අවශ්‍ය යාත්‍රා සහ දැල් ආම්පන්න ලබාදීම
- හානියට පත් ධීවර යාත්‍රා පිළිසකර කරගැනීම සඳහා මූල්‍යාධාර ලබාදීම
- මිරිදිය ධීවර කටයුතු සඳහා යාන්ත්‍රික නොවන ධීවර යාත්‍රා හා දැල් ලබා දීම
- ධීවර නිෂ්පාදන අලෙවිය සඳහා පාපැදි සහ මෙවලම් ලබාදීම
- අයිස් නිෂ්පාදනය සහ ශීතාගාර පහසුකම් සැපයීම
- අභ්‍යන්තර ජලාශයන් සඳහා මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම
- තාවකාලිකව මත්ස්‍ය මිලදී ගැනීමේ මධ්‍යස්ථාන රැ අලෙවිසැල් සහ වෙළඳපොළ සබඳතා ශක්තිමත් කිරීම
- ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ පැවති ආයතනික ව්‍යුහය නැවත ස්ථාපිත කිරීම සහ ශක්තිමත් කිරීම
- ධීවර සමුපකාර සමිති යළි ස්ථාපිත කිරීම හා ශක්තිමත් කිරීම
- කෙටිකාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ධීවර කාන්තාවන් සඳහා නිපුණතා සංවර්ධනය
- පාරම්පරික නොවන ජලජීවී වගාවන් හඳුන්වාදීම

**දැවුරුදු සංවර්ධන වැඩසටහන**

- ධීවර තොටුපළ සහ නැංගුරම් පොළවල් සංවර්ධනය කිරීම
- ධීවර වරායන් ස්ථාපිත කිරීම සහ සංවර්ධනය කිරීම
- බහුදින ධීවර යාත්‍රා හඳුන්වා දීම
- නාරා ආයතන සඳහා වූ ප්‍රාදේශීය මධ්‍යස්ථානය පිහිටුවීම සහ මත්ස්‍ය තොග ගණනය සඳහා වූ සමීක්ෂණ පැවැත්වීම
- මිරිදිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සහ සුළු පරිමාණ මත්ස්‍ය පැටවුන් බෝකිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම
- ඉස්සන් වගාව දියුණු කිරීම සඳහා කලාපීය සැලැස්මක් සකස් කිරීම
- ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය ප්‍රතිසංවර්ධනය කිරීම
- වෙරළ පාරිසරික පද්ධති සංරක්ෂණය